# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2052/26 - 2018 ජනවාරි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2018.01.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 02

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2032/26 හා 2017.08.16 දිනැති, *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සංශෝධිත, අංක 1840/34 හා 2013.12.11 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කොට ඇත.

1. 7 ඡේදයේ 7.3.2.1 කොටස පහත පරිදි සංශෝධනය විය යුතු ය.

   7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්

   අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

2. ඇමුණුම 06 යටතේ අංක 02, අංක 04 හා අංක 05 කොටස්වල 'විභාගය' යන්න වෙනුවට 'කාර්යක්ෂමතා කඩඉම් විභාගය' ලෙස ආදේශ විය යුතු ය.

3. ඇමුණුම 06 සඳහා අවසානයට අංක 06 ලෙස පහත කරුණු එක් කරනු ලැබේ.

6. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු දැනුවත් වී සිටිය යුතු මූලික සිද්ධාන්ත අඩංගු දින 10 කින් යුත් පහත පාඨමාලාව I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුළත සාර්ථකව හදාරා නිම කිරීම මත I ශ්‍රේණියේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

   i. පාඨමාලාව පවත්වන බලධරයා : ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

   ii. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව : I ශ්‍රේණියට නියමිත පුහුණු පාඨමාලාවට අදාළව ඉල්ලුම්පත් කැඳවීම සඳහා වූ නිවේදනය සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර ඒ සඳහා ලැබෙන ඉල්ලුම් පත් ප්‍රමාණය සලකා බැලීමෙන් අනතුරුව වර්ෂයකට පවත්වන වාර ගණන තීරණය කරනු ලබයි.

   iii. පාඨමාලාවේ විෂය නිර්දේශය

| මොඩියුලය | කාලය |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියා පටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන වගකීම් වලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය | දින 02 |
| තොරතුරු දැනගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |


1A - G 26894 — 08 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සටහන :

01. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත රාජ්‍ය සේවා පුහුණු ආයතනය මගින් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර අදාළ මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

02. තවද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ඉහත (01) කොටසින් දක්වා ඇති විභාගය සමත් වීම හෝ (06) කොටස මගින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05 ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදු කරනු නොලැබේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

01 - 521

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.